# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය
(නව නිර්දේශය)

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා BUCU 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. භාරතීය පැවිද්දෙහි පසුබිම දක්වමින්, බෞද්ධ පැවිද්දෙහි සිදු වූ නවීකරණ විෂයෙහි බලපෑ විවිධ සමාජ සාධක පරීක්ෂා කරන්න.

02. සංඝකර්ම හඳුන්වා, බෞද්ධ සංඝකර්මයන්හි අනුගමනය කරන ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ පැහැදිලි කරන්න.

03. පුද්ගල චරිත ශෝධනයෙහි ලා ආදර්ශ කොටගත හැකි පරමාදර්ශය ශ්‍රාවක චරිත දෙකක් පිළිබඳ ප්‍රමාණවත් සටහනක් සපයන්න.

04. ආරාමික කළමනාකරණයෙහි මූලිකාංග හඳුන්වා දෙමින් භික්ෂු සමාජයේ සංවිධානමය පසුබිම තහවුරු කිරීමෙහිලා එමඟින් ලැබෙන පිටිවහල ප්‍රමාණ කරන්න.

05. භාරතීය බෞද්ධ සංඝාරාම ප්‍රභවය හා විකාසය පිළිබඳ අධ්‍යයනයේදී චුල්ලවග්ගපාළි සේනාසනක්ඛන්ධකයෙන් ලැබෙන පිටිවහල කෙතෙක්දැයි පරීක්ෂා කරන්න.

06. 'ස්තූප' යන්න අර්ථකථනය කරමින්, භාරතීය ස්තූපයේ සුවිශේෂ ලක්ෂණ ප්‍රකට කරන්න.

07. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේ බුද්ධ ප්‍රතිමාව නිර්මාණය නොවීමට බලපෑ හේතු දක්වා, ගන්ධාර බුද්ධ ප්‍රතිමාවේ දැකිය හැකි විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.

08. බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපණයෙහි ලා කලා ශිල්පියා විසින් භාවිත මුද්‍රා පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

09. ගෙඩිගේ සම්ප්‍රදායෙහි වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ පරීක්ෂා කරන්න.

10. සාරධර්ම පෝෂණයෙහි ලා බෞද්ධ චිත්‍ර කලාවේ උපයෝගිතාව කෙතෙක්දැයි සනිදර්ශනව පෙන්වා දෙන්න.

***********************************